# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2049/10 – 2017 දෙසැම්බර් මස 11 වැනි සඳුදා – 2017.12.11**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

**වයඹ පළාත් සභාව**

වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක 04 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2017.06.20 වැනි දින සම්මත කරන ලදුව, 2017.11.27 වැනි දින වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම සඳහා මෙහි පහත පළ කරමි.

ආර්. එම්. ආර්. එම්. රත්නායක,<br>
සභා ලේකම්,<br>
වයඹ පළාත් සභාව.

2016 නොවැම්බර් මස 29 වැනි දින,<br>
කුරුණෑගල,<br>
වයඹ පළාත් සභාවේ<br>
සභා ලේකම් කාර්යාලයේ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# වයඹ පළාතේ පළාත් සභාව

## වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක 04 දරන
## ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය

වයඹ පළාතේ පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන, වෙළෙඳ, නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය

## වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක 04 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය

වයඹ පළාත තුළ ස්වශක්තියෙන් නැගී සිටින ග්‍රාමීය ජනතාවක් බිහි කිරීම සඳහාත්, ගම සමෘද්ධිමත් ජීවන මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහාත්, වයඹ පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම සඳහාත්, ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන කාන්තා සමිති, ප්‍රාදේශීය බල මණ්ඩල, දිස්ත්‍රික් බල මණ්ඩල හා පළාත් බල මණ්ඩලය පිහිටුවීම, ලියාපදිංචි කිරීම හා පවත්වාගෙන යාම සඳහාත් සහ ඊට ආනුෂංගික කරුණු සඳහාත් විධිවිධාන සැලස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. දීර්ඝ නාමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154 උ (1) ව්‍යවස්ථාව මගින් පළාත් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එහි 9 වන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ 10 වන වගන්තියේ විධිවිධාන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2017 අංක 04 දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, වයඹ පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලත් දින සිට ක්‍රියාත්මක වන්නේය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

02. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි වේ. ප්‍රඥප්තියේ අරමුණු

(1) ගම සමෘද්ධිමත් ජීවන මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, අධීක්ෂණය කිරීම සඳහා විධිවිධාන සැලස්වීම තුළින් වයඹ පළාතේ ජනතාවගේ ආර්ථික, සමාජයීය, සංස්කෘතික හා ආධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීම සඳහා වයඹ පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම.

(2) ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන කාන්තා සමිති, ප්‍රාදේශීය බල මණ්ඩල, දිස්ත්‍රික් බලමණ්ඩල, පළාත් බල මණ්ඩලය පිහිටුවීම සහ ඒවා ලියාපදිංචි කිරීම, ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම, විගණනය කිරීම, විබද්ධ කිරීම හා ඈවර කිරීම සඳහා වූ විධිවිධාන සැලැස්වීම.

### I කොටස

### පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම එහි සංයුතිය බලතල හා කාර්යභාරය

03. මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටු කිරීම සඳහා "වයඹ පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව" යනුවෙන් හඳුන්වනු ලබන (මින් මතු මෙහි දෙපාර්තමේන්තුව වශයෙන් සඳහන් කරනු ලබන) දෙපාර්තමේන්තුවක් පිහිටුවිය යුතු වන්නේ ය. පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම.

04. මෙම දෙපාර්තමේන්තුව අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් ග්‍රාම සංවර්ධන විෂයට අදාල සියලු කටයුතු ඉටු කිරීමට ද, නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ද, වෙනත් නීති කෘත්‍යයන් සම්බන්ධයෙන් නිදහසට කරුණු කීමට ද බලය ඇති සංස්ථාපිත ආයතනයක් වන්නේ ය. දෙපාර්තමේන්තුව නීතිගත ආයතනයක් බව.

05. (1) මෙම දෙපාර්තමේන්තුව පළාත් අධ්‍යක්ෂවරයෙකුගෙන්, සහකාර අධ්‍යක්ෂවරයෙක්, දිස්ත්‍රික් නිලධාරින් දෙදෙනෙක්, ග්‍රාම සංවර්ධන නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් ඇතුළු සහය කාර්ය මණ්ඩලයකින් සමන්විත විය යුත්තේය. නිලධාරීන් පත් කිරීම.

(2) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින වන විට වයඹ පළාතේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුගත තනතුරු දැරූ සියලුම නිලධාරීන්, සහ සේවකයන් මෙම ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබූ නිලධරයන් ලෙස සැලකිය යුතු වන්නේ ය.

06. දෙපාර්තමේන්තුව වෙත පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා වයඹ පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමුවන පංතියේ නිලධරයෙකු විෂයභාර අමාත්‍යවරයා විමසා වයඹ පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතු වේ. අධ්‍යක්ෂවරයා පත් කිරීම.

පළාත් අධ්‍යක්ෂවරයාගේ බලතල.

07. (1) මෙම ප්‍රඥප්තියෙහි හෝ ඊට ආනුෂංගික කාරණා හෝ පනවනු ලබන නියෝග විධිවිධාන හෝ ක්‍රියාත්මක කිරීමේ බලතල ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අධීක්ෂණයට යටත්ව ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂවරයා වෙත පැවරෙන්නේ ය.

(2) අධ්‍යක්ෂවරයා විසින් අවස්ථාවෝචිත පරිදි ස්වකීය බලතල දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරින් වෙත පැවරිය හැක්කේ ය.

රාජ්‍ය සේවකයෙක් බව.

08. මෙම ප්‍රඥප්තියෙහි කාර්යයන් සඳහා පත් කරනු ලබන සියළු නිලධාරින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රාජ්‍ය සේවකයන් වශයෙන් සැලකිය යුත්තේ ය.

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය.

09. වයඹ පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

(1) ස්ව ශක්තියෙන් නැගී සිටීම සඳහා ජනතාව සංවිධානගත කිරීම.

(2) පළාත තුළ ග්‍රාම සංවර්ධනය උදෙසා වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම සහ අධීක්ෂණය කිරීම.

(3) ග්‍රාම සංවර්ධන කටයුතු උදෙසා ජනතාවගේ දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම, ව්‍යාපෘති හා පුහුණු වැඩ සටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(4) ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාම සංවර්ධන කාන්තා සමිති, ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල, ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩල සහ ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලය පිහිටුවීම, ලියාපදිංචි කිරීම, ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම, විගණනය කිරීම, ඒකාබද්ධ කිරීම, විබද්ධ කිරීම සහ ඈවර කිරීම.

දෙපාර්තමේන්තුවේ බලතල

10. ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ බලතල:

(1) වයඹ පළාත තුල ලියාපදිංචි කර ඇති ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන කාන්තා සමිති ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල, ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩල සහ ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය, ගිණුම් පරීක්ෂා කිරීම, විමර්ශනය කිරීම.

(2) ඒ සඳහා අවශ්‍ය ලිපි ලේඛන පරීක්ෂා කිරීම සහ තොරතුරු ලබා ගැනීම, ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂට හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකුට කළ හැක්කේ ය.

## II කොටස

### ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාම සංවර්ධන කාන්තා සමිති පිහිටුවීම, ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, විගණනය කිරීම, ඒකාබද්ධ කිරීම, විබද්ධ කිරීම, ලියාපදිංචිය අවලංගු කිරීම, ඈවර කිරීම සහ සමිති විසුරුවා හැරීම.

ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාම සංවර්ධන කාන්තා සමිති පිහිටුවීම.

11. (1) වයඹ පළාතේ ජනතාවගේ ආර්ථික සමාජයීය හා සංස්කෘතික සංවර්ධනය සඳහා ගමකට හෝ ග්‍රාම නිලධාරි වසමකට එක් ග්‍රාම සංවර්ධන සමිතියක් හෝ ග්‍රාම සංවර්ධන කාන්තා සමිතියක් හෝ එසේ නොවේ නම් එකී සමිති වර්ග දෙකම පිහිටුවා ගත හැකි අතර ග්‍රාම සංවර්ධන කාන්තා සමිතියක් සඳහා ස්ත්‍රී පාර්ශවය පමණක් සාමාජිකත්වය දැරිය යුතු ය.

(2) එසේ පිහිටුවා ගන්නා ලද සමිතියක සාමාජිකත්වය ලබා ගත හැකි අවම වයස් සීමාව අවුරුදු 18ක් ද, උපරිම වයස් සීමාව අවුරුදු 70 ක්ද විය යුතු අතර, සමිතියක් පිහිටුවීම සඳහා අවම වශයෙන් සාමාජිකයින් 21ක් සිටිය යුතුය.

(3) ඉහත 11 (1) උප වගන්තිය යටතේ පිහිටුවා ගන්නා ලද සමිතිවල නිල කාලය සමිතිය පිහිටු වූ දින සිට වසරක කාලයක් වන්නේ ය. නිල කාලය අවසන් වූ දින සිට මසක් ඇතුළත වාර්ෂික නිලවරණය පැවැත්විය යුතුය.

12. ඉහත 11 වන වගන්තිය යටතේ පිහිටුවා ගනු ලබන සෑම සමිතියක්ම හා මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම ආරම්භ වන විට වයඹ පළාත තුල ලියාපදිංචි කර ඇති ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාම සංවර්ධන කාන්තා සමිති ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යවරයා විසින් පනවනු ලබන නියෝග මගින් නියම කරනු ලබන ආකාරයට ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය ලබා ගත යුතුය. සමිති ලියාපදිංචි කිරීම

13. (1) මෙම ප්‍රඥප්තියේ 12 වන වගන්තිය යටතේ පනවනු ලබන නියෝගවලින් නියම කර ඇති නිර්ණායකයන්ට අනුකූල නොවන ග්‍රාම සංවර්ධන සමිති සහ ග්‍රාම සංවර්ධන කාන්තා සමිති ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් නොලබන්නේය. ලියාපදිංචි කිරීම සඳහා නුසුදුසුකම්.

(2) එසේ ලියාපදිංචියට සුදුසුකම් නොලබන බව නිවැරදි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත ලද දිනයේ සිට දින 45ක් ඇතුළත අධ්‍යක්ෂවරයා විසින් අදළ අයදුම්කරුවන් වෙත දන්වා යැවිය යුත්තේය.

14. සමිතියක බල ප්‍රදේශය ග්‍රාම නිලධාරි වසමකට වඩා පුළුල් නොවිය යුතු අතර, ගමකට වඩා කුඩා නොවිය යුතුය. එසේ වුවද එක් ගමක් තුළ භූගෝලීය වශයෙන් අනන්‍යතාවයක් ඇති ගම් ගොඩැල්ලක්, යායක් හෝ වතු ඒකකයක් සඳහා එක් ගමක් තුළ සමිති කිහිපයක් වුව ද පිහිටුවිය හැකිය.

15. එක් සමිති බල ප්‍රදේශයක් තුළ පිහිටුවිය හැක්කේ එක් වර්ගයක එක් සමිතියක් පමණි. සමිති බල ප්‍රදේශය.

16. ග්‍රාම සංවර්ධන සමිතිවල සහ ග්‍රාම සංවර්ධන කාන්තා සමිතිවල කාර්යභාරය පහත සඳහන් පරිදි විය යුත්තේය. සමිති බල ප්‍රදේශ එක් සමිතියකට සීමා කිරීම

(1) වයඹ පළාත් සභා බල ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ආර්ථික හා සමාජයීය තත්ත්වයන් දියුණු කිරීම තුළින් යහපත් සමාජයක් නිර්මාණය කිරීමට අවශ්‍ය වන්නා වූ තිරසර සංවර්ධන වැඩසටහන් ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාම සංවර්ධන කාන්තා සමිති මගින් විධිමත්ව ක්‍රියාත්මක කිරීම. ග්‍රාම සංවර්ධන සමිතියක හා ග්‍රාම සංවර්ධන කාන්තා සමිතියක කාර්යභාරය

(2) සාමාජිකයන්ගේත්, බල ප්‍රදේශ තුළ වැසියන්ගේත්, සදචාරය සහ සහයෝගිතාවය ඇති කිරීම සඳහා ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සාහිත්‍ය කටයුතු සහ ක්‍රීඩා කටයුතු වැඩි දියුණු කිරීම, ශ්‍රමදන පැවැත්වීම යනාදී කටයුතු කිරීම.

(3) මානව සම්පත් සංවර්ධනයට ප්‍රමුඛත්වය දෙමින් ජනතාවගේ දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(4) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා දයක වීම.

(5) සමිති සාමාජිකයන්ගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම සඳහා හිතකර පරිසරයක් ගොඩනැගීම පිණිස පවුලේ ආදයම් වියදම් කළමනාකරණය හුරු කිරීම.

(6) සමිතියේ අරමුණු සහ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් ගොඩනගා ගැනීම.

(7) සමිති අරමුදලේ ආදයම් සහ වියදම් සඳහා නිසියාකාර විධිමත් ගිණුම් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම.

(8) සමිති සාමාජිකයන්ගේ සුභ සාධන කටයුතු පවත්වාගෙන යාම සඳහා කටයුතු කිරීම.

17. මෙම ප්‍රඥප්තියේ සලසා ඇති විධිවිධානවලට පටහැනිව ක්‍රියාත්මක කරනු ලබන, නියෝගවලින් නියම කර ඇති නියමයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු නොකරන සහ අක්‍රීය තත්ත්වයට පත්වූ ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන කාන්තා සමිතිවල ලියාපදිංචිය අවලංගු කළ හැකිය. ලියාපදිංචිය අවලංගු කිරීම

අවලංගු කරන ලද සමිති සතු දේපළ.

18. එසේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ සමිතියකට අයත් සියළු දේපළ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය වෙත පැවරේ. විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නියම කරනු ලබන නිලධාරියකු එම දේපළ අමාත්‍යාංශය වෙනුවෙන් භාරගෙන ආරක්ෂා කිරීමට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය.

අභියාචනා බලතල

19. මෙම ප්‍රඥප්තියේ 12 වන වගන්තිය යටතේ පනවනු ලබන නියෝග මගින් නියම කර ඇති ප්‍රමිතීන්ට අනුකූල නොවීම මත 13 වන වගන්තියට අනුව ලියාපදිංචි ප්‍රතික්ෂේප කිරීම සහ අවලංගු කිරීම්වලට අදල අභියාචනා ලියාපදිංචිය ප්‍රතික්ෂේප කරන බව දන්වා යැවූ දින සිට දින 90ක් ඇතුළත ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා මගින් විෂයභාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ ය. අභියාචනා සම්බන්ධයෙන් අවසන් තීරණය විෂයභාර අමාත්‍යවරයාගේ තීරණය වන්නේ ය.

සමිති ඒකාබද්ධ කිරීම

20. එක් බල ප්‍රදේශයක් තුළ එක් වර්ගයකට සමිති එකකට වැඩි ප්‍රමාණයක් පවතින විට අධ්‍යක්ෂවරයාගේ තීරණයට අනු එම සමිති ඒකාබද්ධ කළ හැකිය. සමිති අරමුදල් ඒකාබද්ධ සමිති පොදු ගිණුමකට බැර කළ යුතුය.

සමිති විබද්ධ කිරීම

21. ග්‍රාම සංවර්ධන සමිතියක්, ග්‍රාම සංවර්ධන කාන්තා සමිතියක් විබද්ධ කොට පවත්වාගෙන යාම සුදුසු යැයි අධ්‍යක්ෂවරයා තීරණය කරනු ලබන අවස්ථාවක සමිති විබද්ධ කිරීම කළ හැකිය. එම සමිතිවල වත්කම් සමිති මහා සභාව විමසා අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයට බෙදීයාම් කළ යුතුය.

සමිති ව්‍යවස්ථාව

22. මෙම ප්‍රඥප්තියේ 12 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද ග්‍රාම සංවර්ධන සමිති සහ ග්‍රාම සංවර්ධන කාන්තා සමිති මෙම වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝගවලින් දක්වා ඇති ආකාරයට පොදු ව්‍යවස්ථාවක් යටතේ ක්‍රියාත්මක විය යුත්තේය.

සමිති අරමුදල්

23. (1) 12 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද සෑම ග්‍රාම සංවර්ධන සමිතියක්, ග්‍රාම සංවර්ධන කාන්තා සමිතියක් සඳහාම අරමුදලක් පිහිටුවිය යුතු වේ.

(2) අරමුදල් කළමනාකරණයට අදල විධිවිධාන විෂයභාර අමාත්‍යවරයාගේ විසින් 22 වන වගන්තිය යටතේ පනවනු ලබන නියෝග මගින් කළ යුත්තේ ය.

සමිති ඈවර කිරීම

24. අක්‍රිය ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාම සංවර්ධන කාන්තා සමිති ප්‍රතිසංවිධානය කිරීමට අපහසු අවස්ථාවල සමිති ඈවර කිරීම කළ යුතු ය. එම සමිති අරමුදල් අධ්‍යක්ෂවරයා භාරයේ පවතින ඈවර ගිණුමකට බැර කළ යුතු ය.

## III කොටස

### ග්‍රාම සංවර්ධන ප්‍රදේශීය බල මණ්ඩල, දිස්ත්‍රික් බල මණ්ඩල සහ පළාත් බල මණ්ඩලය පිහිටුවීම, ලියාපදිංචි කිරීම, පවත්වාගෙන යාම හා අවලංගු කිරීම.

ග්‍රාම සංවර්ධන ප්‍රාදේශිය බල මණ්ඩල පිහිටුවීම.

25 සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් තුළම ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලයක් පිහිටුවිය යුතු අතර, එම බල මණ්ඩලය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ පිහිටුවන ලද ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාම සංවර්ධන කාන්තා සමිතිවල සභාපතිවරුන්ගෙන්, ලේකම්වරුන් සහ භාණ්ඩාගාරිකවරුන්ගෙන් සමන්විත විය යුත්තේ ය.

ග්‍රාම සංවර්ධන ප්‍රාදේශිය බල මණ්ඩලවල ව්‍යුහය.

26 ග්‍රාම සංවර්ධන ප්‍රාදේශිය බල මණ්ඩලේ සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන කාන්තා සමිති සභාපතිවරුන්, ලේකම්වරුන් සහ භාණ්ඩාගාරිකවරුන් අතරින් පත් විය යුතු අතර ප්‍රාදේශිය බල මණ්ඩලයේ උපදේශක වශයෙන් එම ප්‍රාදේශිය බල මණ්ඩලය පිහිටි කොට්ඨාසයේ ග්‍රාම සංවර්ධන නිලධාරි නිල බලයෙන් පත්විය යුතුය. එම ප්‍රාදේශිය බල මණ්ඩලය පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශිය ලේකම් නිලබලයෙන් අනුශාසක විය යුතු ය.

27 ප්‍රාදේශීය බල මණ්ඩලවල කාර්යභාරය

ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලවල කාර්යභාරය.

(1) ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාම සංවර්ධන කාන්තා සමිති ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම තුළින් එම සමිතිවල පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා මග පෙන්වීම.

(2) ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩල හා පළාත් බල මණ්ඩලය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

(3) අධ්‍යක්ෂවරයා විසින් ලබා දෙන උපදෙස්වලට අනුකූලව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ඒකාබද්ධ ග්‍රාම සංවර්ධන සැළැස්මක් සකස් කිරීම සඳහා ග්‍රාම සංවර්ධන නිලධාරිවරයාට සහයෝගය ලබා දීම.

(4) ග්‍රාම සංවර්ධන සමිති සහ ග්‍රාම සංවර්ධන කාන්තා සමිති අතර මනා සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීම සහ එම සමිති අරමුදල් වර්ධනය කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම.

(5) තම බල ප්‍රදේශය තුළ සංවර්ධන ක්‍රියාවලිය සඳහා ජනතාව යොමු කිරීමේ පුරෝගාමී මෙහෙවරක් ඉටු කිරීම.

28 ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලවල සභාපතිවරුන්, ලේකම්වරුන් සහ භාණ්ඩාගාරිකවරුන්ගේ නියෝජනයෙන් දිස්ත්‍රික් බල මණ්ඩල පිහිටුවනු ලැබේ.

දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන බල මණ්ඩල පිහිටුවීම.

29 දිස්ත්‍රික් බල මණ්ඩලවල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික ප්‍රාදේශීය බල මණ්ඩලවල සාමාජිකයන් අතරින් පත්විය යුතු අතර දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරි නිල බලයෙන් උපදේශක විය යුතු ය. ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂ නිල බලයෙන් එහි අනුශාසක වන්නේ ය.

දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන බල මණ්ඩලවල ව්‍යුහය

30 දිස්ත්‍රික් බල මණ්ඩලවල කාර්යභාරය.

දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන බල මණ්ඩලවල කාර්යභාරය

(1) දිස්ත්‍රික්කය තුළ ග්‍රාම සංවර්ධන සමිති ප්‍රවර්ධන සඳහා සහාය දීම, උපදෙස් ලබාදීම හා මග පෙන්වීම.

(2) ප්‍රාදේශීය බල මණ්ඩලවල ග්‍රාම සංවර්ධන සැළසුම් ආශ්‍රයෙන් දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන සැළැස්ම සකස් කිරීම සඳහා දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරිවරයාට සහාය වීම.

(3) දිස්ත්‍රික්කයේ පවතින අනෙකුත් සංවිධාන සමඟ සහයෝගයෙන් ක්‍රියා කරමින් දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන සැළැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහාය ලබා දීම.

(4) පළාත් බල මණ්ඩලය නියෝජනය කිරීම.

31 ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩල දෙකෙහි ම එකතුවෙන් පළාත්බල මණ්ඩලය පිහිටුවනු ලැබේ.

පළාත් ග්‍රාම සංවර්ධන බල මණ්ඩලය පිහිටුවීම.

32 පළාත් බල මණ්ඩලයේ සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික දිස්ත්‍රික් බල මණ්ඩල සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගත යුතු ය. ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ නිල බලයෙන් උපදේශක විය යුතුය. ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් අනුශාසක විය යුත්තේ ය.

පළාත් ග්‍රාම සංවර්ධන බල මණ්ඩලයේ ව්‍යුහය.

33 පළාත් ග්‍රාම සංවර්ධන බල මණ්ඩලයේ කාර්යභාරය.

පළාත් ග්‍රාම සංවර්ධන බල මණ්ඩලයේ කාර්යභාරය.

(1) පළාත් ග්‍රාම සංවර්ධන සැළැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම.

(2) ග්‍රාම සංවර්ධනයෙහිලා අවශ්‍ය වන විශේෂ ව්‍යාපෘති හඳුනා ගැනීම, සැළසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා සහයෝගය ලබා දීම.

(3) පළාතේ ග්‍රාම සංවර්ධන පුහුණු කටයුතු සහ පර්යේෂණ කටයුතු සඳහා සහය ලබා දීම.

ග්‍රාම සංවර්ධන බල මණ්ඩල ලියාපදිංචි කිරීම, ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම හා ලියාපදිංචිය අවලංගු කිරීම.

34 (1) මෙම ප්‍රඥප්තියේ 25,28 සහ 31 යන වගන්ති යටතේ පිහිටුවනු ලැබූ සෑම බල මණ්ඩලයක්ම ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂ විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන නියෝගවලින් නියම කර ඇති නිර්ණායකයන්ට අනුකූල නොවන ග්‍රාම සංවර්ධන බල මණ්ඩල ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් නොලබන අතර, ඒ බව ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලුම්කරුවන්ට දන්වා යැවිය යුත්තේ ය.

(4) මෙම ප්‍රඥප්තියෙ සලසා ඇති විධිවිධානවලට පටහැනිව ක්‍රියාත්මක කරනු ලබන නියෝගවලින් නියම කර ඇති නියමයන්ට හා ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු නොකරන සහ අක්‍රිය තත්ත්වයට පත් වූ 'ග්‍රාම සංවර්ධන බල මන්ඩලවල ලියාපදිංචිය අවලංගු කළ හැකි ය.

සමිති බල මණ්ඩල ලියාපදිංචි කිරීම, ප්‍රතික්ෂේප කිරීම හා අවලංගු කිරීම පිළිබඳ අභියාචනා කිරීම.

35 බල මණ්ඩල ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීම හා ලියාපදිංචිය අවලංගු කිරීම්වලට අදළ අභියාචනා දින 90 ක් ඇතුළත ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයා මඟින් විෂයභාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර අභියාචනා සම්බන්ධයෙන් අවසාන තීරණය විෂයභාර අමාත්‍යවරයාගේ තීරණය වන්නේ ය.

බල මණ්ඩල ව්‍යවස්ථා.

36 නියෝගවල දැක්වෙන ආකාරයට මෙම ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ ලියාපදිංචි කරනු ලැබූ බල මණ්ඩලය යටතේ පොදු ව්‍යවස්ථාවක් යටතේ ලියාපදිංචි විය යුත්තේ ය.

බල මණ්ඩල අරමුදල්.

37 (1) ලියාපදිංචි කරනු ලබූ සෑම බල මණ්ඩලයකටම තම අරමුණු ඉටු කර ගැනීම සඳහා අරමුදලක් පිහිටුවනු ලැබිය හැකි වන්නේ ය.

(2) විෂයභාර අමාත්‍යවරයාගේ විසින් පවත්වනු ලබන නියෝග මගින් මෙම අරමුදල පරිපාලන විය යුත්තේ ය.

අරමුදල් විගණනය

38 ඉහත 37 (1) උපවගන්තිය යටතේ පිහිටුවනු ලබන අරමුදල් ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් විගණනය කළ යුතු වන්නේ ය.

## IV කොටස

### වැරදි හා දණ්ඩන

වැරදි

39 (1) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද යම් නියමයක් හෝ නියෝගයක් යටතේ සාදන ලද හෝ සපයනු ලබන යම් වාර්තාවක හෝ වෙනත් ලේඛනයක් මත දැන දැනම පවතින තොරතුරුවල යම් වෙනසක් ඇති කරන්නාවූ ද, අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් කරන්නාවූ ද,

(2) මෙම ප්‍රඥප්තියෙන් නියම කර ඇති යම් තොරතුරක් හෝ වාර්තාවක් සැපයීම පැහැර හරින්නාවූ හෝ ප්‍රතික්ෂේප කරන්නා වූ ද,

(3) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයාගේ නිවේදන හෝ නියෝග සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින්නාවූ ද,

(4) මෙම ප්‍රඥප්තියෙන් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ යම් නිලධාරියෙකු වෙත බලය පැවරී ඇති හෝ පවරනු ලැබ ඇති යම් බලතල කර්තව්‍ය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී ඒ නිලධාරියාට අවහිර හෝ බාධා කරන්නා වූ ද,

(5) මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හා විධිවිධානයක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම වුවමනාවෙන්ම පැහැර හරින හෝ වුවමනාවෙන්ම අවහිර කරන්නා වූ ද,

යම් තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේ ය.

40. මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරනු ලැබූ විට නඩු පැවරීමේ බලය ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂකවරයා වෙත හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධරයෙකු සතු වන්නේ ය. නඩු පැවරීමේ බලය

41. මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරනු ලබන සෑම තැනැත්තෙකුම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව, රුපියල් දසදහසක (රුපියල් 10,000.00) අවමයකට හා රුපියල් ලක්ෂය (රුපියල් 100,000.00) නොඉක්මවන දඩයකට හෝ මාස හයක් (06) නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ යන දෙආකාරයෙන් එක් ආකාරයකට දණ්ඩනයකට හෝ එකී දණ්ඩනයන් දෙකටම හෝ යටත් කළ යුතු වන්නේ ය. දඬුවම්

## V වන කොටස

## පොදු විධිවිධාන

42. (1) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ කාරණා සම්බන්ධයෙන් නියෝග සෑදීමට විෂය භාර අමාත්‍යවරයාට බලතල ඇත්තේ ය. නියෝග පැනවීම.

(2) අමාත්‍යවරයා විසින් පනවනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළකොට දින 30 ක කාලයක් ඉකුත් වූ වහාම පළාත් සභාවේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(3) පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි නියෝගය යටතේ කලින් කරන ලද ක්‍රියාවකට හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

43. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

44. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, අර්ථ නිරූපණය

''පළාත් සභාව'' යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව ද,

'ආණ්ඩුකාරවරයා'' යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා ද,

''විෂය භාර අමාත්‍යවරයා'' යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාද,

''ලේකම්වරයා'' යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ද,

''පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව'' යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂය සඳහා පිහිටුවනු ලබන දෙපාර්තමේන්තුව ද,

''අධ්‍යක්ෂවරයා'' යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂවරයා ද,

''නිලධාරියා'' යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ග්‍රාම සංවර්ධන නිලධාරීන්. සංවර්ධන නිලධාරීන් (ග්‍රාම සංවර්ධන), මැහුම් උපදේශිකාවන් හා අනෙකුත් නිලධාරීන් ද,

''ග්‍රාම සංවර්ධන සමිති'' යන්නෙන් ග්‍රාම සංවර්ධන සමිති හා ග්‍රාම සංවර්ධන කාන්තා සමිති ද,

''සමිතියක බල ප්‍රදේශය'' යන්නෙන් ග්‍රාම නිලධාරි වසමකට වඩා පුළුල් නොවිය යුතු වන්නාවූ ද,

''ප්‍රාදේශීය බල මණ්ඩල'' යන්නෙන් වයඹ පළාත තුල එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට එක බැගින් ලියාපදිංචි කළ ප්‍රාදේශීය ග්‍රාම සංවර්ධන බල මණ්ඩල ද,

''දිස්ත්‍රික් බල මණ්ඩල'' යන්නෙන් වයඹ පළාත තුල කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක දෙකට එක බැගින් ලියාපදිංචි කළ දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන බල මණ්ඩල ද,

''පළාත් බල මණ්ඩලය'' යන්නෙන් ලියාපදිංචි කළ වයඹ පළාත් ග්‍රාම සංවර්ධන බල මණ්ඩලය ද,

''ග්‍රාම සංවර්ධන බල මණ්ඩල'' යන්නෙන් ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩල ද, ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩල ද, ග්‍රාම සංවර්ධන පළාත් බල මණ්ඩලය ද,

'සාමාජිකයා'' යන්නෙන් ග්‍රාම සංවර්ධන සමිති වන විට එක් එක් සාමාජිකයන්ද ප්‍රාදේශීය බල මණ්ඩල වන විට ග්‍රාම සංවර්ධන සමිති ද, දිස්ත්‍රික් බල මණ්ඩල වන විට ප්‍රාදේශීය බල මණ්ඩල ද, පළාත් බල මණ්ඩලය වන විට දිස්ත්‍රික් බල මණ්ඩල නියෝජනය කරන ප්‍රාදේශීය බල මණ්ඩල ද,

''ව්‍යවස්ථාව'' යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ සාදන ලද නියෝග යටතේ පිහිටුවන ලද ග්‍රාම සංවර්ධන සමිති, ග්‍රාම සංවර්ධන කාන්තා සමිති සහ බල මණ්ඩලවල අනුමත කරන ලද ව්‍යවස්ථා ද,

''නියෝග'' යන්නෙන් මෙම ප්‍රඥප්තියේ විධිවිධානවලට යටත්ව සාදන ලද නියෝග ද,
අදහස් වේ.

12 - 853

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.